# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2481/22 - 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2026.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රුක්දේවී පපෙවුවා හිමාලි ප්‍රනාන්දු, වන මා විසින් 2026 ජුලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මෙම ඇමුණුමෙහි දක්වා ඇති ආකෘතියෙන් යුතුව සෑම ලියාපදිංචි තැනැත්තකු විසින්ම නිකුත් කළ යුතු බදු ඉන්වොයිසියේ ආකෘතිය හා පිරිවිතර මෙම නියෝගය මගින් නිශ්චිතව දක්වනු ලැබේ.

කොමසාරිස් ජනරාල් විසින් මෙම ආකෘතිය සහ පිරිවිතර අවශ්‍ය පරිදි වරින් වර සංශෝධනය කළ හැකිය.

2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/05 දරන ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද ආකෘතිපත්‍රය සහ පිරිවිතර තවදුරටත් විකල්ප වශයෙන් පවතින අතර 2026 ජුලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

**රුක්දේවී පපෙවුවා හිමාලි ප්‍රනාන්දු,**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 27 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

**ඇමුණුම I**

**බදු ඉන්වොයිසියේ පිරිවිතර**

**1. මාතෘකාව සහ ශීර්ෂය**

1.1 මෙම පිරිවිතරයන්ට අනුකූලව නිකුත් කරනු ලබන සෑම ඉන්වොයිසියකම "බදු ඉන්වොයිසිය" යනුවෙන් පැහැදිලිව මාතෘකාව යෙදිය යුතුය.

1A - G 46518 — 04 (2026/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1.2 මාතෘකාව පැහැදිලි හඳුනාගත හැකි වන අයුරින් තද කළු හෝ මතු කර දැක්වෙන අකුරු (highlighted text) යොදා ගනිමින් ඉන්වොයිසියේ මුහුණත මත කැපී පෙනෙන තැනක යෙදිය යුතුය.

**2. එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි සහතිකයේ දැක්වෙන පරිදි සැපයුම්කරු පිළිබඳ විස්තර**

2.1 බදු ඉන්වොයිසියේ වම්පස ඉහළ කෙළවරේ

අ. සැපයුම්කරු බදු සඳහා ලියාපදිංචි වූ අංකය [දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඉලක්කම් නවයකින් (9) සමන්විත බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය - TIN];

ආ. සැපයුම්කරුගේ නම;

ඇ. සැපයුම්කරුගේ ලිපිනය;

ඈ. දුරකථන අංකය (අත්‍යවශ්‍ය නොවේ)

ඇතුළුව සැපයුම්කරු පිළිබඳව තොරතුරු දැක්විය යුතුය.

**3. එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි සහතිකයේ දැක්වෙන පරිදි ගැනුම්කරු පිළිබඳ විස්තර**

3.1 බදු ඉන්වොයිසියේ දකුණුපස ඉහළ කෙළවරේ හෝ සැපයුම්කරු පිළිබඳ විස්තරවලට පහළින්

අ. ගැනුම්කරු බදු සඳහා ලියාපදිංචි වූ අංකය [දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ඉලක්කම් නවයකින් (9) සමන්විත බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය - TIN];

ආ. ගැනුම්කරුගේ නම;

ඇ. ගැනුම්කරුගේ ලිපිනය;

ඈ. දුරකථන අංකය (අත්‍යවශ්‍ය නොවේ)

ඇතුළුව ගැනුම්කරු පිළිබඳව තොරතුරු දැක්විය යුතුය.

**4. ඉන්වොයිසියේ සඳහන් විය යුතු විස්තර**

4.1. බදු ඉන්වොයිසියේ, යටත් පිරිසෙයින්, ඉන්වොයිසිය හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතුය.

**අ. ඉන්වොයිසියේ අනුක්‍රමික අංකය -**

ඉන්වොයිසියේ අනුක්‍රමික අංකය දැක්වීමේදී සියලුම ලියාපදිංචි තැනැත්තන් පහත සඳහන් ආකෘතියට අනුගත විය යුතුය.

**YYMMM_QQQQ_XXXX**, එහිදී:

i. "YY" මගින් ඉන්වොයිසිය නිකුත් කරන ලද ලිත් වර්ෂයේ අවසාන ඉලක්කම් දෙක නියෝජනය වේ;

ii. "MMM" මගින් ඉන්වොයිසිය නිකුත් කළ ලිත් මාසයේ ඉංග්‍රීසි නාමේ පළමු අක්ෂර තුන කැපිටල් අකුරුවලින් නියෝජනය වේ;

iii. "QQQQ" යනු ශාඛා, අංශ, ඒකක, ව්‍යාපෘති, ගනුදෙනුකරුවන් හෝ යම් වර්ගීකරණයක් ඇතුළත් සංවිධාන අස්ථිත්ව පරාසයක් හඳුනාගැනීම සඳහා යොදා ගනු ලබන අක්ෂර සහ අංකවලින් සමන්විත කේතයකි. එවැනි කේතයකට නියම කරනු ලැබිය හැකි පරිදි, යටත් පිරිසෙයින්, එක් ඉලක්කමක්වත් ඇතුළත් විය යුතු අතර ඉලක්කම් ගණන පහළොවකට නොවැඩි විය යුතුය.

iv. "XXXXX" යනු ඉන්වොයිසියේ සංඛ්‍යාත්මක අනුක්‍රමික අංකය වන අතර එය මුළුමනින්ම සංඛ්‍යාත්මක අක්ෂරවලින් සමන්විත විය යුතු අතර වර්ණමාලාවේ කිසිදු අක්ෂරයක් හෝ සංකේතයක් ඇතුළත් නො විය යුතු ය. එවැනි අනුක්‍රමික අංකයක් පෙර මාසයේ නිකුත් කරන ලද අවසාන අංකයේ සිට ආරම්භ විය යුතුය. කෙසේ උවද, අවශ්‍ය අවස්ථාවල දී එම අංක යෙදීම එක් එක් මාසයේ හෝ වර්ෂයේ ආරම්භයේ සිට නැවත ආරම්භ කළ හැකිය.

v. ඉහත අනිවාර්ය ඉලක්කම්, අකුරු සහ සංකේත ඇතුළත් ඉන්වොයිසියේ අනුක්‍රමික අංකයට කිසිදු ඉඩක් (space) අඩංගු නොවිය යුතු අතර අක්ෂර හතළිහකට (40) සීමා විය යුතු ය.

උදාහරණ: අංක 03 ශාඛාව (BR03) විසින් 2026 ජූලි මාසයේ දී නිකුත් කරනු ලබන පළමු බදු ඉන්වොයිසියට පහත සඳහන් අනුක්‍රමික අංකය ලබා දිය හැකිය:

**26JUL _BR03_1**

ආ. **ඉන්වොයිසියේ දිනය -** MM/DD/YYYY (මාසය/ දිනය/ වර්ෂය) ආකෘතියෙන් ප්‍රකාශිත ඉන්වොයිසිය නිකුත් කළ දිනය.

ඇ. **සැපයුම් ස්ථානය -** බදු ඉන්වොයිසිය නිකුත් කරන ස්ථානය භාණ්ඩ හෝ සේවා සැපයීම ප්‍රථමයෙන් ආරම්භ වන ස්ථානයෙන් වෙනස් වන කල්හි එසේ බෙදා හැරීම ආරම්භ වන ස්ථානය ප්‍රකාශ කළ හැකි ය (අත්‍යවශ්‍ය නොවේ).

ඈ. **සැපයුම් භාර දෙන දිනය -** MM/DD/YYYY (මාසය/ දිනය/ වර්ෂය) ආකෘතියෙන් ප්‍රකාශිත භාණ්ඩ හෝ සේවා සැපයීම සිදු කළ දිනය.

ඉ. **සැපයුම පිළිබඳ විස්තරය -** සපයන ලද භාණ්ඩ හෝ සේවා පිළිබඳ පැහැදිලි විස්තරයක්.

ඊ. **ප්‍රමාණය හෝ පරිමාව -** සපයන ලද භාණ්ඩ හෝ සේවාවල මැනිය හැකි ප්‍රමාණය.

උ. **සැපයුමේ වටිනාකම -** ශත අගය (දශමස්ථාන දෙකක්) සහිතව ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් කළ යුතු අතර එයට:

i. එකතු කළ අගය මත බදු (VAT) හැර ගෙවිය යුතු ශුද්ධ මුදල වශයෙන් සැපයුමේ වටිනාකම
ii. එම සැපයුම් වටිනාකම මත අය කරනු ලබන එකතු කළ අගය මත බද්ද(VAT);
iii. එකතු කළ අගය මත බද්ද (VAT) ඇතුළුව ලද හෝ ලැබිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව.
iv. මුළු ප්‍රතිෂ්ඨාව වචනවලින් (අත්‍යවශ්‍ය නොවේ.)

ඇතුළත් විය යුතුයි.

ඌ. **ගෙවීම් කරන ආකාරය -** ගෙවීම් කරන ආකාරය මුදලින් ද, බැංකු ගිණුමක් හරහා මුදල් මාරු කිරීමකින් ද, චෙක්පතකින් ද, ණය/හර කාඩ්පතකින් ද, ජංගම මෙවලමක් භාවිතයෙන් කරනු ලබන ගෙවීමකින් හෝ මාර්ගගත ගෙවීමකින් ද යන වග සඳහන් කළ යුතු ය. බදු ඉන්වොයිසිය නිකුත් කරන අවස්ථාවේ දී ගෙවීම් කරන ආකාරය සඳහන් කිරීම ප්‍රායෝගික නොවන විට දී ගෙවීම් කිරීමට අපේක්ෂා කරන ආකාරය සඳහන් කළ හැකි ය (අත්‍යවශ්‍ය නොවේ).

4.2 බදු ඉන්වොයිසියේ විශේෂයෙන්ම එකතු කළ අගය මත බද්දට (VAT) යටතේ භාණ්ඩ හා සේවා පමණක් ඇතුළත් විය යුතු ය.

**5. සැපයුම පිළිබඳ අතිරේක තොරතුරු**

5.1 සැපයුම්කරුට, අවශ්‍ය නම්, භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් නිශ්චිත අතිරේක තොරතුරු සඳහන් කළ හැකි ය.

**6. ආදර්ශ බදු ඉන්වොයිසියක් පහත දී ඇත.**

6.1 පහත දක්වා ඇති ආකෘති පත්‍රය බදු ඉන්වොයිසියක් සඳහා ආදර්ශයක් ලෙස භාවිතා කළ හැකි ය. ඉහත දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සැපයුම්කරුට අවශ්‍ය පරිදි එහි වෙනස්කම් සිදු කර ගත හැකි ය.

6.2 භාණ්ඩ සහ සේවා සැපයුම සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහන් කිරීම සඳහා සැපයුම්කරුට අවශ්‍ය පරිදි බදු ඉන්වොයිසියට අතිරේක තීරු සහ පේළි එකතු කළ හැකි ය.

6.3 සැපයුම්කරුට සිය ලාංඡනය, වෙළඳ සළකුණ හෝ වෙනත් යම් අදාළ තොරතුරක් බදු ඉන්වොයිසියේ පිටු ශීර්ෂකයේ (header) සහ/හෝ පාදකයේ (footer) ප්‍රදර්ශනය කළ හැකි ය.

6.4 තරු සළකුණක් සමග දක්වා ඇති අයිතම අත්‍යවශ්‍ය නොවන අතර සැපයුම්කරු සතුව එම තොරතුරු තිබේනම් ඒවා බදු ඉන්වොයිසියේ සඳහන් කළ හැකි ය.

බදු ඉන්වොයිසිය

ඉන්වොයිසි දිනය:

බදු ඉන්වොයිසි අංකය:

සැපයුම්කරුගේ TIN අංකය:
සැපයුම්කරුගේ නම:
ලිපිනය:

දුරකථන අංකය*:

ගැනුම්කරුගේ TIN අංකය:
ගැනුම්කරුගේ නම:
ලිපිනය:

දුරකථන අංකය*:

සැපයුම් කරන දිනය:

සැපයුම් කරන ස්ථානය*:

අතිරේක තොරතුරු, තිබේ නම්*:

| **යොමුව*** | **භාණ්ඩ හෝ සේවා පිළිබඳ විස්තරය** | **ප්‍රමාණය** | **ඒකක මිල** | **එ.අ.බ. හැර වටිනාකම (රු.)** |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| සැපයුමේ මුළු වටිනාකම: | | | | |
| එ.අ.බ. මුදල (සැපයුමේ මුළු වටිනාකම @ එ.අ.බ. අනුපාතිකය) | | | | |
| එ.අ.බ. සහිතව මුළු මුදල/ප්‍රතිෂ්ඨාව: | | | | |

මුළු මුදල වචනයෙන්*:

ගෙවීම් කරන ආකාරය*:

EOG 03 - 0219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.